**බේරුවල නගර සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
--------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 24 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 01 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට බේරුවල නගර සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1:3:1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම
----------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

1:3:2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා සභාව විසින් අනුගමනය කර තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලෙජර ගිණුම් හතරක 2013 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.6,165,640 ක් වූ හර ශේෂ දෙකක් හා එකතුව රු.4,261,973 ක් වූ බැර ශේෂ දෙකක් ශේෂ පිරික්සුමට ගෙන තිබුණද එම ශේෂයන් ශේෂ පත්‍රයට සටහන් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කර තිබූ ශේෂ පත්‍රය රු.3,633,975 කින් තුලනය වී නොතිබුණි.

(ඇ) ශේෂ පත්‍රයේ දක්වා තිබූ ජංගම වත්කම් හා වගකීම්වල එකතුවේ වෙනස රු.26,593,379 ක් වුවද ශේෂ පත්‍රයේ එය රු.25,471,756 ක් ලෙස දක්වා තිබුණි.

(ඈ) ලෙජර් ගිණුම් අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 3 ක බිල් කළ ආදායම් එකතුව රු.10,153,095 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමට එම වටිනාකම රු.10,078,522 ක් ලෙස සටහන් කර තිබීම නිසා වර්ෂයේ ආදායම රු.74,573 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ආදායම් විෂයයන් 5 කට අදාල ලේජර් ගිණුම් වල ආරම්භක, අවසාන ශේෂ සහ ඊට අදාල අනෙකුත් ගැලපීම් සිදු නොකර රු.31,460,755 ක් ආදායම් හා වියදම් ගිණුමට සටහන් කර තිබුණද එම සටහන් ගැලපීමෙන් පසු නිවැරදි ආදායම රු.38,184,597 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම් රු.6,723,842 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වියදම් සඳහා රු.3,940,125 ක් ණයහිමියන් ලෙස සටහන් කර තිබුණද එම ශේෂ අදාල වැය ශීර්ෂයන්ට ගිණුම් ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.13,900 ක් වූ වානේ කාර්යාල අල්මාරියක් සහ රු.8,000 ක් වූ ලියන මේසයක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.204,695 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 21ක් ප්‍රාග්ධනිත කර තිබුණි.

(එ) පළාත් පාලන කොමසාරිස්වරයා විසින් 2013 ජනවාරි 28 දින සභාවට ලබාද තිබූ රු.3,178,456 ක් වූ කැබ් රථයේ වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි.

(ඒ) වැටුප් ප්‍රතිපූර්ණ ලබාදීමේදී කැබ් රථයේ ණය වාරිකය වශයෙන් අඩුකරගෙන තිබූ රු.706,273 ක් බස්නාහිර පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2014.08.20 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයෙ ස්ථාවර තැන්පත් පොලී වශයෙන් ලැබුණු රු.685,300 ක් පොලී ආදායම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු වලට අදාල වරෙන්තු ගාස්තු හා දඩ රු.226,501 ක් ආදායම් ගිණුමට සටහන් කර නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ වර්ෂයේ වරිපනම් බදු කපා හැරීම් රු.209,167 ක් වියදම් ගිණුමට සටහන් කර නොතිබුණි.

(ග) මස් වෙළඳසැල් වෙනුවෙන් තබා තිබූ තැන්පත් මුදල වූ රු.350,910 ක් වර්ෂය අවසානයට මස් කඩ කුලී වශයෙන් ආදායම් ගිණුමට ගිණුම්ගත කර තිබුණද ඊට අදාල ගැලපීම් සටහන තැන්පත් ගිණුමට ඇතුලත් කර නොතිබුණි.

(ච) සමාලෝචිත වර්ෂයේදී මාර්ග තලන යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගෙන තිබූ ණය මුදල රු.8,540,000 ක් ගිණුම් ගත කිරීමේදී දේශීය ණය සහ ප්‍රාග්ධන ආධාර වශයෙන් දෙවරක් සටහන් කර තිබුණි.

(ජ) රු.10,675,000 ක් වූ මාර්ග තලන යන්ත්‍රයක වටිනාකම ප්‍රාග්ධනිත කර තිබියදී නැවතත් සහාදායක මුදල වූ රු.135,000 ක් ප්‍රාග්ධනය යෙදුමට අදායමින් දායක වීමේ ගිණුමට ගිණුම්ගත කර තිබුණි.

(ට) සමාලෝචිත වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ව්‍යාපෘති 06 ක් සඳහා ලැබී තිබූ රු.5,254,074 ක්, මූලධන ආධාර වශයෙනුත් එම ව්‍යාපෘතිවල වියදම වූ රු.4,796,980 ක්, ප්‍රාග්ධන වැය වශයෙනුත් ගිණුම්ගත වී නොතිබුණි.

(ඩ) පළාත් නිශ්චිත ව්‍යාපෘති යටතේ ව්‍යාපෘති 3 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවා ගෙන තිබූ එකතුව රු.311,197 ක් වූ මුදල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ණ) වැටුපෙන් අයකර ගෙන තිබූ නිල නිවාස කුලී රු.25,685 ක් ද වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයකරගෙන තිබූ, රු.449,060 ක් ද වැඩියෙන් ගෙවා නැවත අයකරගෙන තිබූ රු.18,000 ක් ද වැටුප් ගිණුමට ගැලපීම වෙනුවට නොගෙවූ වැටුප් ණයහිමියන් වශයෙන් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ත) ඉකුත් වර්ෂයේ අවසන් ගිණුම්වල දක්වා තිබූ රු.9,740 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනා ගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කර තිබූ ශේෂ පිරික්සුම අනුව එම ශේෂය රු.80,351 ක හර ශේෂයක් වූ අතර එය ශේෂ පත්‍රයේ දක්වා තිබුණේ රු.35,588 ක බැර ශේෂයක් වශයෙනි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.5,961,076 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,365,490 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,057,067 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 4,076 | 1,883 | 8,902 |
| (ii.) | බදු කුලී | 10,153 | 11,458 | 1,432 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 258 | 259 | -- |
| (iv.) | වෙනත් ආදායම් | -- | 10,953 | -- |

2:2:2 වරිපනම් බදු

2013 හා ඊට පෙර වර්ෂවලට අදාලව 2014 සැප්තැම්බර් 30 දිනට හිඟව පැවති වරිපනම් බදු ශේෂය රු.7,337,531 ක් වූ අතර එම ශේෂය තුළ රු.10,000 ට වැඩි හිඟ ශේෂයක් පැවති දේපලවලින් රු.1,692,857 ක් අයවිය යුතුව තිබුණි.

2:2:3 කඩකුලී

2013 සැප්තැම්බර් 03 දින නාගරික වෙළඳපොල පිටුපස මාලු වෙළඳසැල් 11 ක හිඟ ආදායම් කපා හැර තිබුණ අතර 2013 සැප්තැම්බර් මාසයේ සිට 2014 ජුලි මාසය දක්වාත් එම වෙළඳසැල් නැවත ටෙන්ඩර් කර ලබා දී නොතිබුණි.

2.3 අවිධිමත් ගනුදෙනු

නගර සභා ආඥා පනතේ 159(ඊ) වගන්තිය අනුව යම් ආගමික, පුණ්‍ය, සංස්කෘතික කාර්යයක් සම්බන්ධයෙන් එක් වර්ෂයකට දරන වියදමේ මුළු එකතුව රු.5,000 කට වඩා වැඩිවන්නේ නම් අමාත්‍යවරයාගේ පූර්ව අවසරය ලබාගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව පොදු රාජ්‍ය මණ්ඩල රැස්වීම් සඳහා පැවැත්වෙන *'සිව්දිගින් හරසර'* උත්සවය නිමිත්තෙන් රු.14,100 ක මුදලක් සහා අරමුදලින් වැය කර තිබුණි.

2.4 මෙහෙයුම්/ කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------------

(අ) 2008 සිට 2013 දක්වා කාලය තුලදි ලබා දි තිබූ රු.213,790 ක් වූ අත්තිකාරම් 2013 දෙසැම්බර් 31 දක්වාත් නිරවුල් කර නොතිබූ අතර 2008 වර්ෂයට පෙර සිට පැවත එන රු.104,244 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂයක් ද විය.

(ආ) සේවය හැර ගිය, මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 92 කගෙන් අයවිය යුතු රු.148,099 ක් වූ ණය ශේෂයක් 2014 ඔක්තෝබර් 31 වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයට පෙර සිට පැවත එන රු.228,300 ක් වූ විදුලිය ගබඩා ශේෂය සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කර ගැනිම කටයුතු කර නොතිබුණි.

2:5 **<u>කසළ බැහැර කිරිම සඳහා ඉඩමක් මිළදි ගැනීම</u>**

සභා අරමුදලින් රු.2,500,000 ක් ගෙවා කසල බැහැර කිරීමට හා කසල ප්‍රතිචක්‍රීකරණය කිරීමේ මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා බේරුවල හලවෙල පිහිටි පර්චස් 100 ක ප්‍රමාණයේ ඉඩමක් මිලදී ගෙන තිබුණි. මේ සම්බනධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 මැයි 21 දිනැතිව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉඩමේ වටිනාකම සඳහා සභාව විසින් තක්සේරු වාර්තාවක් ඉල්ලා තිබු අතර පර්චසයක් රු.5,000 බැගින් පර්චස් 100 සඳහා රු.500,000 ක් ලෙස තක්සේරු වාර්තාවක් 2013 අගෝස්තු 05 දින එවා තිබුණි.

(ආ) මෙම ඉඩම අයිතිකරුවන් විසින් පර්චසයක් රු.25,000 කට විකිණිමට කැමති බවත්, අයිතිකරුවන්ගේ එම ඉල්ලීම පරිදි ඉඩම මිලදී ගැනීමට සභාවද ඒකමතිකව තීරණය කළ බවත් එසේ හෙයින් එම කරුණ සළකා බලා තක්සේරු වාර්තාව වැඩි කිරීමට කටයුතු කරන ලෙස සභාවේ ලේකම්වරයා විසින් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2013 අගෝස්තු 22 දින නැවත දන්වා යවා තිබුණි.

(ඇ) සභාපතිවරයා විසින් 2013 සැප්තැම්බර් 20 දින ඉඩම මිලදී ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ (බ.ප.) අනුමැතිය ඉල්ලා යවා තිබූ අතර පළාත් පාලන ආයතන සංවර්ධන කාර්ය සඳහා අවශ්‍ය වන දේපලක් ඉඩම් අත්පත් කර ගැනීමේ විධි විධාන යටතේ අත්පත් කර ගැනීමට හැකියාව තිබියදී රාජ්‍ය තක්සේරුව මහින් තීරණය වන මිල ප්‍රමාණයකට හැර ඊට වැඩි මුදලකට අදාල ඉඩම මිලදී ගැනීම සඳහා එකඟ විය නොහැකි බව බස්නාහිර පළාත් පාලන කොමසාරිස්වරයා විසින් දන්වා තිබුණි.

(ඈ) 2013 සැප්තැම්බර් 18 දින ප්‍රධාන තක්සේරුකරු විසින් එවා තිබූ ලිපිය මගින් ඉහත තක්සේරුව සංශෝධනය කිරීමට අවශ්‍ය නොවන බව දන්වා තිබුණි.

(ඉ) තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සංශෝධිත තක්සේරු වාර්තාවක් ලබා දී නොතිබියදී හා පළාත් පාලන කොමසාරිස් විසින් තක්සේරු වටිනාකම ඉක්මවා ඉඩම මිලදී ගැනීමට එකඟතාවය ලබා දිය නොහැකි බව දන්වා තිබියදීත් රු.2,500,000 ක් ගෙවා සභාව විසින් අදාල ඉඩම මිලදී ගෙන තිබුණි.

(ඊ) 2014 ජනවාරි 16 දින මෙම ඉඩමේ වෙළඳ වටිනාකම දන්වා වාර්තාවක් ලබා දෙන ලෙස සභාවේ සභාපතිවරයා විසින් පළාත් ආදායම් කොමසාරිස් වෙත දන්වා යවා තිබුණි.

එම ඉල්ලීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා සභාපතිවරයා විසින් සභාවේ උපදේශක විශ්‍රාමික ඉංජිනේරුවරයෙකු 2014 පෙබරවාරි 25 දින යවා තිබුණි. එම සාකච්ඡාවේදී ඉඩමේ වෙළඳ වටිනාකම රු.2,850,000 ක් බව දන්වා තිබූ බවත් ඒ අනුව ගෙවූ මුද්දර ගාස්තු වටිනාකමට වඩා තවදුරටත් රු.14,000 ක් මුද්දර ගාස්තු වශයෙන් ගෙවිය යුතු බව පළාත් ආදායම් කොමසාරිස් විසින් දන්වා එවා ඇති බවත් සභාවේ උපදේශකවරයා විසින් සටහන් කර තිබූ අතර ඒ අනුව එම මුදල පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි.

(උ) මේ අනුව රු.500,000 ක් ලෙස දක්වා තිබූ තක්සේරු වටිනාකම නොසළකා රු.2,500,000 කට ඉඩම මිලදී ගැනීමත්, මුද්දර ගාස්තු ලෙස වැඩිපුර රු.14,000 ක් ගෙවා තිබීමත් නිසා ඉඩම මිලදී ගැනීම වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය හා තක්සේරු වටිනාකම ඉක්මවා රු.2,014,000 ක් වැඩියෙන් ගෙවා තිබූ බව විගණනයේදි අනාවරණය විය.

2.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
--------------------------------
බල ප්‍රදේශයෙන් එකතු කරන කසල බැහැර කිරීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් සභාව විසින් අනුගමනය කර නොතිබ අතර එසේ එකතු කරනු ලබන කසල ඉඩමකට ගෙන ගොස් තුනී කර වරින් වර පස් දැමීම සිදු කර තිබුණි. කසල තුනී කිරීම සඳහා වේන් ලෝඩරයක් කුලී පදනම මත ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවා පැයකට රු.2,000 ක් ගෙවීමේ පදනම මත පෞද්ගලික ආයතනයක් 2013 ජනවාරි 23 දින තෝරාගෙන තිබූ නමුත් එම ආයතනයෙන් යන්ත්‍රය ලබා නොගෙන වෙනත් පද්ගලයෙකුගෙන් එම සේවාව ලබාගෙන ගමන් වාර 4 ක් සඳහා රු.264,000 ක් වැය කර තිබුණි.
මීට අමතරව කසල බැහැර කරන ඉඩමට ප්‍රවේශ වන මාර්ගය පස් දමා සැකසීම වෙනුවෙන් රු.78,550 ක්ද, ප්‍රවාහන වියදම් වෙනුවෙන් රු.69,300 ක්ද වෙනත් වියදම් රු.54,725 ක් ද වශයෙන් 2013 වර්ෂය තුළ කසල තුනී කිරීම සඳහා වියදම ලෙස රු.466,575 ක් වැය කර තිබුණි.

2.7 කාර්යසාධනය
-------------------
2013 වර්ෂය සඳහා මහ නැඟුම ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 22 ක් සඳහා රු.10,778,645 ක ප්‍රතිපාදන අනුමත කර තිබූ නමුත් 2013 වර්ෂය තුළ එකී එක් ව්‍යාපෘතියකවත් ඉටු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන
--------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) අයවැයකරණය